# 01.පරිගණකයේ වැදගත්කම

පාඩම හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. පරිගණකයේ කොටස් හඳුනාගෙන අදාල පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න .

   ( මූසිකය, පද්ධතිඒකකය, රවුටරය, සංදර්ශකය, ස්පීකරය, යතුරුපුවරුව, මුද්‍රණයන්ත්‍රය)




2. පරිගණකයේ කාර්යය විස්තර කරන්න.
3. පරිගණකයේ ලාක්ෂණික ගුණාංග 4ක් ලියන්න.
4. නිහිත පරිගණක සහිත උපාංග යනු මොනවද? ඒ සඳහා උදාහරණ 3 ක්ලියන්න.
5. පරිගණකය යනු කොටස් ගණනක එකතුවකි. එම කොටස් යොදාගන්නා කාර්යයේ ස්වභාවය අනුව වර්ග කළහැක. ඒවා,
   a. ආදානඋපක්‍රම-
      පරිගණකයට දත්ත ලබාදීම සඳහා භාවිත කරන උපකරණයි. ඒසඳහා උදාහරණ 4ක් ලියන්න.
   b. ප්‍රතිදානඋපක්‍රම-
      පරිගණකය තුළ සකස් කළදත්ත, තොරතුරු පිටතට ලබාගැනීම සඳහා භාවිත කරන උපකරණයි. ඒසඳහා උදාහරණ 4ක්ලියන්න.
   c. ආචයන උපක්‍රම-
      නැවත ප්‍රයෝජනයට ගැනීම සඳහා දත්ත, තොරතුරු තැන්පත් කරතැබිය හැකි පරිගණක උපකරණයි.ආචයන උපකරණ, අභ්‍යන්තර ආචයන හා බාහිර ආචයන ලෙස වර්ග කළහැක. ඒ සඳහා උදාහරණ වෙන වෙනම ලියන්න.
   d. සන්නිවේදනඋපක්‍රම-
      පරිගණකය තුළ ඇති දත්ත, තොරතුරු හුවමාරු කරගැනීම සඳහා භාවිත උපකරණයි. ඒසඳහා උදාහරණ ලියන්න.
   e. මධ්‍යසැකසුම්ඒකකය -
      පරිගණකය මෙහෙයවීමේ ක්‍රියාවලිය හා ලබාදෙන ලද උපදෙස් වලට අනුව දත්ත සකස්කිරීමේ ක්‍රියාවලිය සිදුකරයි.
   f. ප්‍රධාන මතකය -
      පරිගණකය ක්‍රියාත්මකව පවතින විට දත්ත ,තොරතුරු හා උපදෙස් තාවකාලිකව රඳවා තබාගන්නා උපාංගයයි.

      උදාහරණ- සසම්භාවී ප්‍රවේශ මතකය

සැකසුම- ජයමිණි පූර්ණිමා බණ්ඩාර (ර/විද්‍යාලෝක ම.ම.වි)